## නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

### 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නියාමන) - එච්. එම්. 1-1 "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" තනතුරු 01කි

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

සමග

අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) වරලත් ඉංජිනේරුවරයකු වීම.

සහ

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක " කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

   හෝ

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරි (නියාමන / මෙහෙයුම් නඩත්තු / නීති / වාස්තු විද්‍යාඥ) තනතුරේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

වයස අවුරුදු 35ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප HM 1-1 රු.80,295- 15X 2,270 = රු. 114,345.00

- ඉන්ධන දීමනාව සමග තිලරථයක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් ලබනු ඇත.
- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

### 2. සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත්/ පරිපාලන) - එම්. එම්. 1-1 "කළමනාකාර" තනතුරු 01 කි

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එම ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

   හෝ

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM) අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

වයස අවු. 22 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප - MM 1-1- රු.53,175 - 10X1,375 - 15X1,910 = රු. 95,575/=

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

### 3. ලේකම් - ජේ. එම්. 1-1 "කනිෂ්ඨ කළමනාකාර" සේවා ගණය තනතුරු 01කි

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. ලේකම්වරුන්ගේ ක්ෂේත්‍රයට අදාළ " වරලත් ලේකම්" පරිචය පිළිබඳ සහතිකයක් වරලත් ලේකම් ආයතනය මඟින් ලබා තිබීම

   සහ

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ලේකම් පරිචය පිළිබඳ වසර පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

   හෝ

2. වරලත් ආයතනික ලේකම් ආයතනයේ අවසන් විභාගය සම්පූර්ණ කර තිබීම.

   සහ

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ලේකම් පරිචය පිළිබඳ වසර පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

   සැලකිය යුතුය -: ලඝුලේඛනය සහ පරිගණක තාක්ෂණය පිළිබඳ දැනීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

   හෝ

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-1) II වන ශ්‍රේණියේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### 4. පරිපාලන නිලධාරි - තනතුරු 01කි ජේ. එම්. 1-1 "කනිෂ්ඨ කළමනාකාර" සේවා ගණය

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

රාජ්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලන, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

   හෝ

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

වයස අවු. 22 ට නොඅඩු අවු. 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අංක 3 සහ 4 සඳහන් තනතුරු වලට අදාළ වැටුප - JM 1-1- රු.42,600 - 10X755- 18X1,135 = රු. 70,580/=

- ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

### 5. ඉංජිනේරු සහකාර (සිවිල් / සැලසුම් ශිල්පී / ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ) "කළමනාකරණ සහකාර (තාක්ෂණික)" සේවා ගණය තනතුරු 01 කි

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) වැනි මට්ටමට නොඅඩු ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස**

වයස අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප - MA 2-2 රු.30,310 - 10 X 300 -7X 350 -4X 600 -20X710 = රු. 52,360/=

- ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

### සියලු තනතුරුවලට අදාළ පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයින්නේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 12% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
5. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.
6. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
7. අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් බාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

### අයදුම් කළ යුතු ආකාරය

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2021.03.01 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් කවරාකාරයෙන් හෝ බලපෑම් සිදුකිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ. (Canvassing will be a Disqualification)

**සභාපති,**
**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 2.**